# ලස්සනම අහස

සුභාවිත ගීතය රත්න ශ්‍රී ලකුණ සහෘද සංවාද



ප්‍රවීණ කිවියර හා ගීත රචක රත්න ශ්‍රී විජේ සිංහයන් ගේ ඕස්ට්‍රේලියානු ආගමනයට සමාන්තරව, දෙසැම්බර් මස 20 වන දින ප.ව. 5.30 කීස්බොරෝ හී චැන්ඩ්ලර් ප්‍රජා ශාලාවේ පවැත්වීමට නියමිත "ලස්සනම අහස" නම් සුභාවිත ගී රස වින්දන වැඩසටහන යනු තව දුරටත් නො සැඟවිය යුතු කරුණකි. "සන්නස" පුවත් පත තුළිනුත් පසු ගිය මාස කිහිපය පුරාවට අප ඔබව දැනුවත් කළ අතර "ලස්සනම අහස" සංවිධායක මණ්ඩලය ද අන්තර්ජාලය හා ගුවන් විදුලිය වැනි විවිධ මාධ්‍ය ඔස්සේ ඔබට මෙම වටිනා පණිවුඩය විවිධාකාරයෙන් ලබා දුනි. අද දිනයේ අපේ අරමුණ, "ලස්සනම අහස" පිළිබඳ කතා බහකට එහි ප්‍රධාන



සංවිධායක වන නිරාෂ ගුණසේකර සහෘදයා සම්බන්ධ කර ගැනීමයි.

**මම මුලින් ම අහන්න කැමතියි මෙම වැඩස-ටහනට "ලස්සනම අහස" කියන නම ලැබුණේ කෙසේද කියා?**

රත්න ශ්‍රී විජේසිංහයන් ගේ කවියක කොටසක් තියෙනවා, "මේ ලොව ලස්සනම අහස ඇත්තේ ගමට ඉහළිනි * අම්මා නිදන තැන අගේ සො-හොන උඩිනි" කියලා. මේ කවි පද මාව පුදුමාකාර විදියට සංවේදී කරා. මා විතරක් නොවේ, එතුමා පවා පසු කාලීනව තීරු ලිපි එකතුවකින් සමන්විත කෘතියක් ද නිකුත් කරනවා "ලස්සනම අහස හා මතක සිතිවිලි" කියලා. ඔන්න ඔය කම්පනය තමයි, මටත් මේ වැඩ සටහනට මේ නම යොදන්න මුල් වුණේ.

**ලස්සනම අහස කියන්නේ මෙතක් කලක් අපට දකින්න ලැබුණු සාමාන්‍යය ගීත හෝ විවිධ ප්‍රසංග වලට වඩා තරමක වෙනස් වැඩක්. ඇයි මේ වගේ වැඩක් කරන්න හිතුවේ?**

ඔබ ඇසුවේ ඉතා හොඳ ප්‍රශ්නයක්. ඒකට හේතු කිහිපයක් තියෙනවා. ඇත්තටම අපි දන්නවා ගී සංදර්ශන, හා අනෙකුත් ප්‍රසංගාත්මක දේවල් නම් අපිට අනන්තවත් මෙහිදී දකින්න ලැබෙනවා. නමුත් එතුළින්, ගීතයක් ඇසීම (රස වින්දනය නොවේ ) තුළින් ලැබෙන ක්ෂණික තෘප්තියට එහා ගිය, ප්‍රඥාමය ඥානනයක් අපට ලැබෙනවා ද කියන එක ගැටළුවක්. අපි අපේ දෛනික ප්‍රශ්න ටික පොඩ්ඩක් අමතක කරගන්න, හිසේ කැක්කුමට පැනඩෝල් පෙත්තක් බොනවා වගේ දෙයක් තමයි වැල නො කැඩී මේවාට සහභාගී වී කරන්නේ. නමුත් ගීත රස වින්දනය කියන්නේ ඊට වඩා එහායින් තියෙන ගැඹුරු දෙයක්. පදරුත් මෙන්ම, සංගීතය හා හඬ ඔස්සේ ඇතුළට කිඳා බැස විමසීමට වටිනා විෂයයක් ඒක. අප තුළ රසවින්දනය ගොඩ නැගෙන්නේ අන්න එවැනි වූ සුභාවිත කියැවීමක් තුළ පමණයි.

අනෙක් කරුණ තමයි, ගායක ගායිකාවෝ සිය දහස් ගණන් මෙහෙට ඇවිත් ගීත ගයලා මුදල් උපයා ගෙන ගියාට, ඔවුන් අද එතන ඉන්නේ කවුරුන් නිසාද කියා කවුරුවත් හොයන්නේ නෑ. කොටින් ම කියනවා නම් සමහර ගායක ගායිකාවෝ ගිතයක් ගයද්දී වත්, එහි පද රචනය, සංගීතය කාගෙ දැයි මතක්කර දෙන්න වත් කෘතඥ වෙන්නේ නෑ. අපිත් ඉතින් ඒ වැඩ පිළිවෙලටම අනුබල නොදී අපට පුළුවන් විදියට මේ ගීතවල සැබෑ අයිති කරුවනුත් හඳුන්වා දිය යුතුයි. විමසා බැලිය යුතුයි. උදාහරණයක් විදියට රත්න ශ්‍රී විජේසිංහයන් කියන්නේ ලාංකේය ගීත ක්ෂේත්‍රයට සුභාවිත ගීත 4000 පමණ දායක කළ නිහඬ කලා කරුවෙක්.

**මෙම වැඩසටහනේ තවත් විශේෂයක් වන්නේ මෙය සම්පූර්ණයෙන් ම නොමිලේ කරන වැඩසටහනක්. ඕස්ට්‍රේලියාව වගේ රටක, මෙවැනි විශාල උත්සවයක් නොමිලේ පැවත්වීමට තීරණය කළේ ඇයි?**

ඒකටත් හේතු කිහිපයක් තියෙනවා. ඇත්තටම රත්න ශ්‍රී විජේසිංහයන් කියන්නේ, මට, මගේ කවියට පූර්වාදර්ශී වූ ප්‍රධනම චරිතය. මම ඔහුව ඇසුරු කරන්නට පටන අරන් දැනට වසර 12 පමණ වෙනවා. ඒක නම් ඉතින් බොහොම කෙටි කාලයක්. මට වඩා සෑහෙන කාලයක් තිස්සේ ඔහුව ළඟින් ඇසුරු කරපු බොහෝ අය ඉන්න පුළුවන් ඕස්ට්‍රේලියාවේ මේ වන විටත්. නමුත් මට අවශ්‍යය වුණා මෙන්න මේ නිහතමානී, නිහඬ කලාකරුවා මෙහාට ගෙන්න ගෙන රට තොට පොඩ්ඩක් පෙන්නලා එතුමාට කිසියම් වූ මානසික නිදහසකුත්, විදේශීය අත්දැකීම් ඇසුරේ ඔහුගේ නව නිර්මාණ වලට ප්‍රවේශයකුත් ලබා දෙන්න. අපි අපේ අම්මලා තාත්තලා ගෙන්න ගන්නවා වගේ තමයි මම ඔහුව ගෙන්න ගන්න හිටියේ. නමුත්, මෙච්චර වටින මනුස්සයෙක් මේ වගේ රටකට ඇවිත් නිකන්ම යන එක අපරාදේ නිසා තමයි අපි මේ උත්සවය සංවිධානය කරන්න තීරණය කළේ. මේ සඳහා මට සුමින්ද නානායක්කාර හා දිලිනි ඊරියවල කියන මගේ මිතුරන්ගෙන් මුල ඉඳන්ම සහය ලබුණා. අපි තිදෙනා මේ උත්සවය තියන්න ඕන කියලා තීරණය කළේ එතුමා මෙහෙට ගෙන්න ගන්න තීරණය කළාට පස්සේ. ඉතින් අපිට ඕන වුණේ නෑ උත්සවයට මුදල් ගාව ගන්න. එහෙම වුණා නම්, ගෙන්වා ගැනීමේ සැබෑ අරමුණ මුදල් යැයි වැරදි අවබෝධයක් ඇතිවනවාට අපි තිදෙනාම අකමැති වුණා. ඉතා අපහසුතා මාධ්‍යයේ වුව ඉතා සතුටින් පෙබරවාරි මාසයේ සිට මුදල් එකතු කරමින් අපි තිදෙනා මේ සඳහා අවශ්‍යය මුදල් සම්පාදනය කරගන්නවා. අදටත් එසේමයි. අපි මේ කරන්නේ සාහිත්‍යයමය දානයක් දෙන එක. මේ සද්කාර්යයට අත ගැහුවේ යහ අරමුණින්. අපේ රසිකයොත් ඒක එදාට තෙරුම් ගනීවි.

**ලස්සනම අහස සඳහා මේ වනවිට ලැබී ඇති ප්‍රතිචාර කොහොමද?**

මට ඇත්තටම හිතා ගන්න බැහැ මෙතුමාට මෙච්චර ආදරේ කරන රසික පිරිසක් ඕස්ට්‍රේලියාවේ ඉන්නවාද කියලා. සමහරු ඇඩිලේඩ්, බ්‍රිස්බේන් වැනි දුර බැහැරින් උත්සවය බැලීමට එන්න නියමිතයි. සමහරු මට කතා කරලා පින් දෙනවා මේ දේ සංවිධානය කළාට. එතුමා ගේ කවි ගීත වලට සංවේදී වූ ඇතැමෙක් පැය ගණන් මාත් එක්ක කතා කළ අවස්ථා තිබුණා අධික ලෙස හැඟීම්බර වෙලා. ටිකට් පතක් නොගැහුවට, මුදල් අපේක්ෂාවෙන් මේ දේ නොකළාට අන්න එවැනි අවංක මිනිසුන් පිරිසකගේ හද පතුළේ තෙත පිසගෙන කණට ඇසෙන ඒ වචන ටිකම අපිට ඇති. මම ආයෙත් සුමින්ද හා දිලිනි මගේ දෙමිතුරන්ව මතක් කරනවා මේ අවස්ථාවේදී මාත් එක්ක දිගටම රැඳී ඉන්නවාට. අපිට අවශ්‍යතා සපුර ගන්න බැරි තරමට ඉල්ලුම වැඩියි දැන් දැන්. උත්සවය නොමිලේ කියා අපිට ඕස්ට්‍රේලියාවේ සිටින සියළුම රසිකයන්ගේ ඉල්ලීම් සැපිරීම ප්‍රායෝගික නෑ. අපි අවංකව ඒ පිළිබඳ කණගාටු වන අතර උත්සවයට සහභාගීවීම සඳහා සියලුම කටයුතු සම්පාදනය කරලයි තියෙන්නේ මේ වන විට.

**මේ උත්සවය කලින් දැනුම් දී ඇති පරිදි දෙසැම්බර් 20 දින හරියට ම ප.ව. 5.30 ට පටන් ගන්නවා. ප.ව. 5.30 ට කලින් ඇවිත් අසුන් ගන්න.**

**උත්සවයට සහභාගී වන පිළිවෙල කුමක්ද?**

කවුරු හරි කෙනෙක් මේ උත්සවයට සහභාගී වෙන්න හිතන් හිටියා නම් පළමුවෙන්ම කළ යුතුව තිබුණේ අපට කතා කරන එක. නමුත් මේ ඒ සඳහා කාලය නොවෙයි. මන්ද මේ වන විට සියලුම ආසන පිරී ගොස් අවසන් අතුරු සිදුරු නැතුව. කවුරුහරි කියනවා නම් දැනගෙන හිටියේ නෑ කියා, එය අපේ වරදක් නොවේ. අපට පුළුවන් හැම අයුරකින්ම අපි අපේ රසිකයන් දැනුවත් කරන්න උත්සාහ ගත්තා. පසු ගිය මාස කිහිපයේ ම අන්තර්ජාලයෙන්( ඊ*මේල්, ෆේස්බුක්, ඔස්නිව්ස්, මෙල්බර්න් ඉවෙන්ට්ස් වැනි ), ගුවන් විදුලියෙන්, සන්නස පුවත් පත මගින් හා සිංහල ප්‍රජාව වැඩිපුර ගැවසෙන ශ්‍රී ලාංකික කඩවල් හා ආගමික සිද්ධස්ථාන වල පෝස්ටර් මගිනුත් මේ දැනුවත් කිරීම කළා. කටින් කට මිතුරන් අතරේත් මේ දැනුම් දීම කළා. දැන් ඉතින් ඒවාට ප්‍රතිචාර දැක්වූ රසික පිරිසක් නිසා අපිට හොඳ සහභාගීත්වයක් එදාට අපේක්ෂා කළ හැකියි. අපිට කතා කළ අනුපිළිවෙලට තමයි අපි ආසන ලබා දෙන්නේ. අපි ඔවුන් ගේ පැමිණුම තහවුරු කරගෙන ප්‍රවේශ පත්‍රයක් වැනි වූ යමක් ලබා දෙනවා. කොටින්ම කියනවා නම් "ඇක්සස් කාඩ්" එකක්. ඒ සඳහා කිසිදු අය කිරීමක් නෑ. උත්සවයට සහභාගී වීමට එය අනිවාර්යයෙන් ම තිබිය යුතු අතර අප වෙතින් ම එයා ලබා ගත යුතු වෙනවා. ඔබට ඒ සඳහා අපහසුතාවක් තිබේ නම්, ඔබගේ ලිපිනය සඳහන් මුද්දර කවරයක් අප වෙත එවන්න වෙනවා එම අවස්ථාවේ අප ඔබට ලබා දෙන ලිපිනයට. අපේ රසිකයන් කරුණාවෙන් තේරුම් ගන්න ඕන ඔබ ප්‍රවේශ පත්‍රයක් මුදලට අරන් ගිහින් බලන වැඩසටහනක් වගේම දෙයක් තමයි මේකත්, නමුත් මෙහිදී ඔබ ගෙන් අය කිරීමක් නෑ. අනෙක් දෙවල් කිසිදු වෙනසක් නෑ. ඒ ඉවසීම හා විනය අපි ඔබෙනුත් බලාපොරොත්තු වෙනවා.

**සංවාද සටහන**
**ජගත් ජේ එදිරිසිංහ**

**උත්සවය දිනට විශේෂයෙන් කියන්න දෙයක් තියෙනවාද?**

මේ උත්සවය කලින් දැනුම් දී ඇති පරිදි දෙසැම්බර් 20 දින හරියට ම ප.ව. 5.30 ට පටන් ගන්නවා. සහභාගී වීම සඳහා ඔබේ ඇක්සස් කාඩ් පත් අනිවාර්යයෙන් ම රැගෙන ආයුතු බව අමතක කරන්න එපා. අපි එදාට බලන්නේ ඒක විතරයි. නමුත් මෙහිදී තවත් විශේෂ දෙයක් කියන්න ඕන. ප.ව. 5.30 ට කලින් ඇවිත් ඔබ අසුන් ගන්න. මන්ද, ඔබගේ ඇක්සස් කාඩ් එකේ ආසන අංකයක් නැති අතර ඔබ එදාට එන පිළිවෙලට ඔබට කැමතිම තැනක අසුන් ගත හැකියි. නමුත්, ඔබ ප. ව. 5.45 වන විටත් පැමිණ නොසිටියේ නම්, ඉතුරුවී ඇති හිස් ආසන වලට, ඇක්සස් කාඩ් පතක් නොමැතිව, උත්සවය විඳිනු රිසිව, එළියේ බලා හිඳින රසිකයන්ට අවස්ථාව දෙන්නට අප තීරණය කළා. මන්ද මේ උත්සවය සම්පූර්ණයෙන් ම නොමිලේ පැවැත්වෙන නිසාත්, උත්සවය මුළුමනින් විඳින්නට රිසි වූවන්ට ප්‍රමුඛත්වය දිය යුතු නිසාත්ය. ඒක නිසා, මම හැමෝගෙන් ම ඉල්ලා සිටිනවා, ඔබට අදාල කාඩ් පත් හිමි වූ පසු, එහි නියම ඵල ප්‍රයෝජනය ගැනීම සඳහා, ප. ව. 5.30 පෙර ඇවිත් ඔබට රිසි වූ හොඳම අසුනක අසුන් ගන්න ලෙස.

**අවසාන වශයෙන් කියන්නට යමක් තියෙනවාද?**

එන්න ඇවිත් මුළුමනින් ම මේ සාහිත්‍යයමය දානය රස විඳින්න. උත්සවයට අනතුරුව, වෙනස් ම පුද්ගලයකු ලෙස, පිරුණු මිනිසකු ලෙස ඔබ පිටව ගියා නම්, එයයි අපි ලබන නිහතමානී සතුට. ස්තුතියි